# සීමා සහිත දළුගම විවිධ සේවා සමූපකාර සමිතිය මහර - කඩවත
# තනතුරු ඇබෑර්තු

සීමා සහිත දළුගම විවිධ සේවා සමූපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ වසර 02ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගෙන් 2024.12.02 දින සිට 2024.12.19 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවාගැනීමේදී, සමූපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 1.2.2 වගන්තිය අනුව සමිතියේ අභ්‍යන්තර සේවකයින්හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

| තනතුර | වැ.ප.අංකය හා ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| සාමාන්‍යාධිකාරී | 101:03<br>III ශ්‍රේණිය | 01 | 23454 - 450 x 10 - 520 x 10 - 650 x 10 = 39654<br>(බ.ප.සමූපකාර සේවක කොමිෂන් සභා අනුමත දීමනාද හිමිවේ.) |

2. මෙම තනතුර ස්ථිරය. සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලට දායකත්වය හිමිය.
3. බඳවා ගැනීමේ සුදුසුකම්.

අ) 101:03 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක සතුටුදායක සේවා පළපුරුද්දක්
හෝ
102:04 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ආ) ජාතික සමූපකාර සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ව්‍යාපාර කළමණාකරණය පිළිබඳව එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමග 102:05 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ඇ) රජය පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ එක් (01) අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමග ආදාළ ක්ෂේත්‍රයේ විධායක/කළමණාකරණ මට්ටමේ වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමග අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

4. වයස් සීමාව - අවුරුදු 30 - 50 (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) (සමූපකාර ක්ෂේත්‍රයේ ස්ථිර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපානු ලබයි.)
5. බඳවා ගැනීමේ ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්
6. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර බඳවාගැනීමේ නිතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට පෙර හෝ පැවැත්වීමේදී හෝ පැවැත්වීමෙන් පසුව හෝ අයදුම්පත අවලංගු කළ හැකිය.
7. වෙනත් සමූපකාර සමිතියක සේවයේ නියුතු ස්ථිර සේවකයෙකු අයදුම්පත් යොමු කරන්නේ නම් තම අයදුම්පත, අයදුම්කරු දැනට සේවය කරන සමිතිය හරහාම එවිය යුතුවේ. වෙනත් සමිතියක සේවකයෙකු, සෘජුවම ඉදිරිපත් කර ඇති අයදුම්පත් කිසිදු හේතුවක් නිසාවත් සළකා බලනු නොලැබේ.
8. අයදුම්පත්‍රය යොමු කිරීම.

i) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**සී/ස දළුගම විවිධ සේවා සමූපකාර සමිතියේ ........................... තනතුර සඳහා බඳවා ගැනීම**" යන්න සඳහන් කළ යුතුය.

ii) **සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024.12.19 වැනි දිනයට හෝ ඊට පෙර ලැබෙන සේ** පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමටද හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

සභාපති,
සී/ස දළුගම විවිධ සේවා සමූපකාර සමිතිය,
මහර, කඩවත.

ගරු සභාපති
සී/ස දළුගම විවිධ සේවා සමූපකාර සමිතිය,

2024.11.29 දින දිය